**ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව - 2023**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයන් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| 2022 වර්ෂයේ ශීර්ෂය - 220 ට අදාළ 154(6) වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (අ) | නිත්‍යානුකූලව දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරාගෙන නොතිබුණු ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කඩිනම් පියවර ගෙන ගිණුම්වල අදාළ ගැලපීම් සිදු කළ යුතුය. | 1.6.1 (ඇ) (i) |
| 1.6.1 (ඇ) | ගිණුම්වල ආරම්භක ශේෂවලට සිදු කරන අසාමාන්‍ය ගැලපීම් සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු සටහන් මගින් හෙළිදරව් කිරිමට කටයුතු කළ යුතුය. | 1.6.1 (ඇ) (ii) |
| 1.6.1 (ආ ) | දෙපාර්තමේන්තුව සතු සියළු වත්කම් කොම්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාකර නිවැරැදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.1 (ඇ) (iii) |
| 1.6.1 (ඉ) | මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරිමේදී නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. අත්පත් කර ගන්නා ස්ථාවර වත්කම් අදාළ මුදල් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් යටතේ වාර්තා කෙරෙන බවට වගබලා ගත යුතුය. | 1.6.1 (ඇ) (vi) |
| 1.6.1 (ඊ) | කල්බදු කාලසීමාවෙන් අනතුරුව දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණු වාහන මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.1 (ඇ)(viii) |
| 1.6.1 (උ) | වැඩ අවසන් ගොඩනැගිලි හා ව්‍යුහවල පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.1 (ඇ) (ix) |
| 1.6.4 (ආ) | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. | 1.6.1 (ඇ) (i) |
| 2.3 (අ) | පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන නියාමනය සඳහා විධිමත් නෛතික රාමුවක් ඇතිකිරීම සඳහා කටයුතු කළ යුතුය. | 2.6 (අ) |
| 2.3 (ඇ) | 2019 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ නොකෙරෙන කාල සීමා සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමට කටයුතු නොකළ යුතුය. | 2.6 (ඊ) |
| 2.1 | ආයතන සංග්‍රහය, ජාතික අයවැය චක්‍රලේඛ සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සේවක ණය අයකිරීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කිරීමේ වගකීම ඉටු නොකළ නිලධාරීන්ගෙන් අයිභාර කිරීමට මුදල් රෙගුලාසි 104 (2) ‘‘ආ’’ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2.4 |

| | | |
|---|---|---|
| 3.5 | රජයේ මුදල් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කරමින් අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ අරමුණු ඉටුකර ගැනීම සඳහා පමණක් ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කළ බව හා විනිවිදභාවයෙන් කටයුතු කළ බව තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගනිමින් ප්‍රසම්පාදනයන් මෙහෙයවිය යුතුය. | 3.5 |
| 3.7 (ආ) | දෙපාර්තමේන්තුව ගෙවූ වැටුප්වලින් හිඟ මුදල් වහාම අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් රෙගුලාසි 104 (2) "ආ" ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අයිහාර කිරීමට හෝ කටයුතු කළ යුතු අතර, පිරිස් පාලන හා වැටුප් පාලන අංශ අතර යාවත්කාලීන අඛණ්ඩ සම්බන්ධතා තහවුරු කෙරෙන පාලන ක්‍රම හඳුන්වා දීමටද කටයුතු කළ යුතුය. | 3.7(ආ) |
| 3.8 (අ) | ඖෂධ උයන් පරිපාලනය විධිමත් කළ යුතු අතර එම ඖෂධ උයන්වලින් ලැබෙන ඵලදාව ආයුර්වේද රෝහල්වල ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට හා ඒ පිළිබඳව ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීමට විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කළ යුතුය. | 3.8 (අ) |
| 3.8 (ඉ) | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මිලදී ගෙන තිබුණු සියළුම යන්ත්‍ර ඵලදායී ලෙස උපයෝජනය කිරීමට හෝ ආයුර්වේද රෝහල්වල හෝ ආයුර්වේද සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම සඳහා ලබාදීමට කටයුතු කළ යුතු අතර මෙම අක්‍රමිකතාවය සඳහා දායක වූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. | 3.2 (ආ) |
| 5 (අ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, රෝහල්, ඖෂධ උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, යනාදී සියළුම අංශවල කටයුතු සම්බන්ධීකරණය කළ හැකි කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. | 3.2 (ඇ) |
| 5 (ඇ) | ආයුර්වේද පර්යේෂණ රෝහල් පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යසාධනය ලඟා කර ගැනීමට සුදුසු පරිදි කාර්යමණ්ඩල ප්‍රතිසංවිධාන සිදුකළ යුතුය. | 5 (ඇ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන මාරු කිරීම් රු. 831,802ක් හා වෙනත් මූලධන වියදම් රු. 3,027,423ක් ලෙස දක්වා තිබුණද, ඒ.සී.ඒ 2(ii) ආකෘතියේ ඉදිරිපත් කරන වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ ප්‍රාග්ධන මාරු කිරීම් රු. 831,802ක් දක්වා නොතිබුණි. ඒ අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ප්‍රාග්ධන මාරු කිරීම් රු.831,802ක් වැඩියෙන්ද වෙනත් මූලධන වියදම් එම ප්‍රමානයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි. | සංසන්දනාත්මක දත්ත පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන තුළ මෙම තොරතුරු දක්වා ඇති අතර ඒසීඒ 2(ii) ආකෘති පත්‍රයේ අතපසුවීමකින් එම සටහන් අංක වලට අදාලව දත්ත ඇතුලත් කිරිමේදී ප්‍රාග්ධන මාරු කිරීම් සඳහා වන කොටස ඉවත් කර ඇති බව. ඒ අනුව ප්‍රාග්ධන මාරු කිරීම් සහ වෙනත් ප්‍රාග්ධන වියදම් නිවැරදි වර්ගීකරණය යටතේ ඉදිරි වර්ෂයේ සිට හෙළිදරව් කිරිමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල ඒසීඒ 2(ii) ආකෘති පත්‍රයේ ප්‍රාග්ධන මාරු කිරීම් සහ වෙනත් ප්‍රාග්ධන වියදම් නිවැරදි වර්ගීකරණය යටතේ හෙළිදරව් කිරිමට කටයුතු කළ යුතුය. |

#### (ආ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරිම්වල එකතුව භාණ්ඩාගාර මුද්‍රිත සටහන ( SA-51) අනුව රු. 306,232ක් ක් වුවද, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය (ඒ.සී.ඒ 07 ආකෘතිය) අනුව රු. 2,623,773 ක් ලෙස රු. 2,317,541 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණන නිරික්ෂණ සමග එකඟ වන බවත් නිවැරදි වර්ගීකරණය යටතේ ඉදිරි වර්ෂයේ සිට හෙළිදරව් කිරිමට කටයුතු කරන බව. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ නිවැරදි වර්ගීකරණය යටතේ හෙළිදරව් කිරිමට කටයුතු කළ යුතුය. |

**(ඈ) මූල්‍ය නොවන වත්කම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිත්‍යානුකූලව දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරාගෙන නොතිබුණු ඉඩම් 12 ක වටිනාකම වූ රු. 2,318,020,000 ක් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු අතර නිත්‍යානුකූලව දෙපාර්තමේන්තුවට අයිතිය පවරා ගෙන තිබුණු ඉඩම් 07 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු ඉඩම් නිරවුල් කර ගැනීමෙන් පසු ඒ ඒ ඉඩම්වල වටිනාකම් හා නිවැරදි දත්ත ගිණුමෙන් ඉදිරිපත් කරන බව, සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි මේ වන විට සියළුම අංශ වෙත තම ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුව හරහා තක්සේරු කර වාර්තා කිරිමට දන්වා යවා ඇති බව හා අම්පාර සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ රෝහල පිහිටි ඉඩම සහ එහි ගොඩනගිලි රු මිලියන 137.1 කට තක්සේරු කර 2024 අප්‍රේල් මස ගිණුම් සාරාංශයෙන් ගිණුම ගත කිරිමට කටයුතු කළ බව. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කඩිනම් පියවර ගෙන ගිණුම්වල අදාළ ගැලපීම් සිදු කළ යුතු අතර පවරාගත් ඉඩම් ගිණුම් වල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සිගාස් පරිගණක මුද්‍රිත සටහන් ප්‍රකාරව වෙනත් යන්ත්‍ර හා උපකරණ වැය විෂය යටතේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන්ට රු.20,996,825ක් ගලපා තිබුණද ඊට අදාල විස්තරාත්මක තොරතුරු පිළියෙල කර ගිණුම් සටහන් මගින් හෙළිදරව් කිරිමට කටයුතු කර නොතිබුණි. | ආරම්භක ශේෂයන්ට සිදු කරන ලද ගැලපීම් ඉදිරි මූල්‍ය ප්‍රකාශවල සටහන් කිරිමට කටයුතු කරන බව. | ගිණුම්වල සිදු කරන අසාමාන්‍ය ගැලපීම් සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු සටහන් මගින් හෙළිදරව් කිරිමට කටයුතු කළ යුතුය. |
| (iii) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් කොම්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාකර තිබුණු ගොඩනැගිලිවල වටිනාකම රු.635,961,733ක්වූ අතර ගිණුම්ගත කළ වටිනාකම 1,161,120,186ක් වූයෙන් රු.525,158,453ක ශුද්ධ වෙනසක් විය. | කොම්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති 06/2023 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි මේ වන විට හඳුන්වාදී ඇති මාර්ග ගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය යටතේ දෙපාර්තමේන්තුව සතු සියළු වත්කම් වාර්තා කිරිමට නියමිත බව හා දැනට වාහන සඳහා වන මොඩියුලය පමණක් ක්‍රියාත්මක කර ඇති බව. | දෙපාර්තමේන්තුව සතු සියළු වත්කම් කොම්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාකර නිවැරැදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | 2022 වර්ෂයේ සිගාස් පරිගණක මුද්‍රිත සටහන් අනුව කාර්යාල උපකරණවල අවසාන ශේෂය රු.76,362,170ක් වුවද, එම ශේෂය 2023 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස සටහන් කිරිමේදී රු.75,972,550ක් ලෙස සටහන් කිරිම හේතුවෙන් රු.389,620ක් අඩුවෙන් ගිණුම් වල දක්වා තිබුණි. | 2023 වර්ෂයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ගොස් අදාළ නිවැරදි කිරිම් කිරිමට කටයුතු කළද තවදුරටත් මේ සඳහා සිදු කළ යුතු ගැලපීම් පවතින බැවින් ඉදිරියේදීද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධවී ශේෂ නිවැරදි කර වාර්තා කිරිමට කටයුතු කරන බව. | දෝශ නිවැරදිව හඳුනාගෙන නිවැරදි කිරිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.1,161,120,186ක්වූ ගොඩනැගිලි හා ව්‍යුහ වටිනාකම තුළ නීත්‍යානුකූලව දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරාගෙන නොතිබුණු ඉඩම් 13ක පවතින රු.1,107,464,440 ක්වූ ගොඩනැගිලිවල වටිනාකම ඇතුළත්ව තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේද අදාල ඉඩම් පවරාගෙන ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු ඉඩම් නිරවුල් කර ගැනීමෙන් පසු ඒ ඒ ඉඩම්වල වටිනාකම් පදනම් කර ගනිමින් ඉදිරියේදී නිවැරදි දත්ත ගිණුම්ගත කරන බව. | දෙපාර්තමේන්තුව සතු ඉඩම් කඩිනමින් නිරවුල් කර ගිණුම් වාර්තාවල ගොඩනැගිලි හා ව්‍යුහ අගයන් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (vi) | 2022 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු පරිගණක උපාංග ශේෂය, විදුලි උපකරණ ශේෂය සහ වෛද්‍ය උපකරණ ශේෂය පිළිවෙලින් රු.5,881,397ක්, රු.14,835,143ක් සහ රු.275,315,783ක් විය. එසේවුවද පිළිවෙලින් ඉකුත් වර්ෂවල සිදුකල රු.10,375,439ක්, රු.6,273,197ක සහ රු.3,638,628ක මිළදී ගැනීම් අදාල විෂයයන් යටතේ නොදක්වා කාර්යාල උපකරණ යටතේ දක්වා තිබුණි. තවද, 2022 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.20,729,160ක්වූ පරිගණක, පරිගණක උපාංග යටතේ නොදක්වා කාර්යාල උපකරණ යටතේ දක්වා තිබුණි. මාරු නියෝග ලබා ගැනීමෙන් අනතුරුව උක්ත අඩුපාඩු නිවැරදි කරන බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේත් එය නිවැරදි කර නොතිබුණි. | සමස්ථයක් ලෙස අදාළ උපකරණවල වටිනාකමෙහි වෙනසක් නොමැති අතර එම වටිනාකම් වර්ගීකරණය කිරීමේදී සිදු වී ඇති දෝෂය නිවැරදි කිරීමට සමස්ථ වත්කම් දත්ත ගොනුවම නැවත යාවත්කාලීන කිරීම සිදු කළ යුතු බැවින් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කර වාර්තා කිරීමට සටහන් කර ගත් බව. | මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. අත්පත් කර ගන්නා ස්ථාවර වත්කම් අදාළ මුදල් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් යටතේ වාර්තා කෙරෙන බවට වගබලා ගත යුතුය. |
| (vii) | ධාවන තත්ත්වයේ නොමැති කැබ් රථ 02 ක්, බස් රථයක් හා යතුරු පැදි 04ක් අපහරණ කටයුතු සඳහා 2022.02.14 සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාරදී තිබුණද, එම වත්කම්වල පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. තවද මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් හෝ එම වත්කම් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | සිගාස් පද්ධතියට ඇතුලත් කර ඇති වාහන සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් මෙම නිවැරදි කිරීම් තවදුරටත් ප්‍රමාදවී ඇති අතර දත්ත පද්ධතිය නිවැරදි කර මේ පිළිබඳව වාර්තා කිරීමට සටහන් කර ගත් බව. | අපහරණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු අතර එම වත්කම් වල පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශවලින් ඉවත් කිරීමට හා මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් තොරතුරු අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (viii) | කල්බදු වාරික ගෙවීම් ක්‍රමය යටතේ 2012 වර්ෂයේදී ටොයෝටා ලංකා ආයතනයෙන් මිලදී ගෙන තිබුණු පිරිවැය රු.8,400,000 ක් වූ වෑන් රථයක් කල්බදු කාලසීමාවෙන් අනතුරුව දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණද, මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | සිගාස් පද්ධතියට ඇතුලත් කර ඇති වාහන සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් මෙම නිවැරදි කිරීම් තවදුරටත් ප්‍රමාදවී ඇති අතර දත්ත පද්ධතිය නිවැරදි කර මේ පිළිබඳව වාර්තා කිරීමට සටහන් කර ගත් බව. | මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ix) | වැඩ අවසන් ගොඩනැගිලි හා ව්‍යුහවල පිරිවැය ප්‍රාග්ධනිත නොකර 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉදිකිරීම් සඳහා දැරූ සම්පූර්ණ වියදම කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.1,035,539,978 ක් දක්වා වර්ධනය වී තිබුණි. | සිගාස් පරිගණක පද්ධතියේ නිවැරදි කිරීම් සිදු කර ඇති බව. | වැඩ අවසන් ගොඩනැගිලි හා ව්‍යුහවල පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **ඇප ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් වන ගැටළුකාරී තත්වය විසඳා ගැනීමට කටයුතු කරමින් පවතින අතර එම කරුණු සම්පූර්ණ කල වහාම ඇප තැන්පත් කිරීමේ ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | **වාහන ලොග් පොත** | | |
| | මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව, යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | යාවත්කාලීන කරගෙන යන බව. | -එම- |
| (iii) | **චෙක්පත් භාරදීමේ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 388 ප්‍රකාරව, යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | චෙක්පත් භාරදීමේ ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන අතර 2023 දෙසැම්බර් මසදී පමණක් ගෙවීම් කරන ලද චෙක්පත් ප්‍රමාණය අධික වූ බැවින් නිසි පරිදි එම ලේඛණය යාවත් කාලීන කිරීමට නොහැකි වී ඇති බව. | . -එම- |

### 1.6.2 විගණන සාක්ෂි නොවීම

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව සතුව රු.93,944,999 ක් වටිනා වාහන පවතින බව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණු නමුත් සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර නොතිබුණු බැවින් දෙපාර්තමේන්තුව සතු සියලු වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපනයවන බවට තහවුරු කර ගැනීමට නොහැකි විය. | සිගාස් පද්ධතියට ඇතුලත් කර ඇති වාහන සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් මෙම නිවැරදි කිරීම් තවදුරටත් ප්‍රමාදවී වී ඇති අතර ප්‍රවාහන හා ගිණුම් අංශ සම්බන්ධිකරණය වෙමින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව දත්ත පද්ධතිය නිවැරදි කර ඉදිරියේදී වාර්තා කිරීමට සටහන් කර ගත් බව. | සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභන්තර විගණන අංශය මගින් සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය පරීක්ෂාවන් සිදු කර අදාල නිලධාරීන් දැනුවත් කර අඩුපාඩු නිවැරදි කිරීමට දැනුම් දී ඇති අතර ඒ පිළිබඳ පසු විපරම්ද සිදු කර ඇති බව දන්වමි. වාර්ෂික සමාලෝචනයක් 2024 වර්ෂයේ සිට රජයේ විගණන අංශය වෙත ලබා දීමට කටයුතු කරන අතර විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වනු ලබන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනත | පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රමය භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි. | පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචිය කිරිම පිළිබද විධිවිධාන ඇතුලත් වන පරිදි ආයුර්වේද සංග්‍රහය සැකසීමට අදාල කටයුතු මේ වන විට නීති කෙටුම්පත් සම්පාදක විසින් සිදුකරගෙන යනු ලබන බව. | පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචිය කිරිම පිළිබද විධිවිධාන ඇතුලත් වන පරිදි නෛතික ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1947 අංක 16 දරන මහ නගර සහා ආඥා පනතේ 127 වගන්තිය | බොරැල්ල ආයුර්වේද ජාතික රෝහල ශික්ෂණ රෝහලක් බවට සංවර්ධනය කිරීමේ 02 වන අදියර යටතේ ඉදිකරන ලද මහල් 08 කින් යුතු නව ගොඩනැගිල්ලේ බිම් මහල ඇතුළුව මහල් 04 ක ඇඳන් 183කින් යුත් සමාන්‍ය වාට්ටු 05ක රෝගී සත්කාර සේවා ක්‍රියාත්මක කර තිබුණු නමුත් මහ නගර සභා ආඥා පනත ප්‍රකාරව අනුකූලතා සහතිකයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | අදාල අඩුපාඩු සම්පූර්ණ කිරිම සඳහා ඇස්තමේන්තු සකසා 2020 වර්ෂයේදී ප්‍රතිපාදන ද වෙන් කර ගන්නා ලද නමුත් කොවිඩ් 19 රෝගීන් එයට යාබද ගොඩනැගිල්ලට ඇතුලත් කර ගත් බැවින් එම කාර්යය ඉටුකර ගැනීමට නොහැකි වූ බව. මෙම තත්තවයට හේතුව දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය නොව ප්‍රතිපාදන සලසා ගැනීමට ඇති දුෂ්කරතාවය බව. | නව ගොඩනැගිල්ලේ මහල් 04 ක සමාන්‍ය වාට්ටු 05ක රෝගී සත්කාර සේවා ක්‍රියාත්මක කරන බැවින් හැකි ඉක්මණින් අනුකූලතා සහතිකය ලබා ගත යුතුය. |

(ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| (i) මුදල්රෙගුලාසි 770 | බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ වියළි ඖෂධ ගබඩාව තුළ දීර්ඝ කාලයක සිට භාවිතයට නුසුදුසු තත්ත්වයේ ඖෂධ වර්ග 12 ක කිලෝග්‍රෑම් 113.5 ක ප්‍රමාණයක්ද වර්ෂ 3කට අධික කාලයක් තිස්සේ භාවිතයට නොගන්නා වියළි ඖෂධ වර්ග 36ක කිලෝග්‍රෑම් 477.6 ක්ද පැවැති නමුත් ඒවා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2024.06.30 දිනට හෝ එදිනට පෙර මුදල් රෙගුලාසි අනුව කටයුතු කර වාර්තා කිරිමට සටහන් කර ගත බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 756(6) | සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු වර්ෂයක ආයුර්වේද රෝහල්වල තොග ගබඩා හා උපගබඩාවල තොග සමීක්ෂණ සිදුකර නොතිබුණි. | තොග ගබඩා හා උප ගබඩා සම්බන්ධයෙන් තොග ලේඛනගත භාණ්ඩ පිළිබඳ වාර්ෂික සමීක්ෂණ සිදු කර නොමැති අතර මෙම කටයුතු අවසන් කර වාර්තා කිරිමට සටහන් කරගත් බව. | -එම- |
| (iii) මුදල් රෙගුලාසි 1647 (ආ) | වාහනද ඒවායේ උපකරණද ඇතුළුව සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ තක්සේරු වටිනාකම රු.13,950,000 ක්වූ වාහන 05ක් සමීක්ෂණයට භාජනය කර නොතිබුණි. | ඔබ විසින් සඳහන් කර ඇති 32-1178 ජීප් රථය අළුත්වැඩියාවන් සඳහා ගරාජයට දමා ඇති අතර අනෙකුත් වාහන මංචන්තුඩුවායි, කයිතඩි, කෝනේෂ්පුරි, අම්පාර රෝහල්වලට අනුයුක්ත කර ඇති බැවින් ඉදිරියේදී අදාල කමිටුව මගින් පරික්ෂා කිරිමට සැලසුම් කර ඇති බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | රජයේ වාහනවල සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා ඉන්ධන දහන පරීක්ෂාව කඩිනමින් සිදු කිරිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලබමින් පවතින බව හා ජුනි 30 දින වන විට සියළු කටයුතු අවසන් කර දැන්වීමට සටහන් කර ගත් බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයේ 2 (iv) ඡේදය ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු. 53,325,525 ක් ගෙවා තිබුණි. | රෝගී සත්කාරක සේවා බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත නොකිරීම හේතුවෙන් පැමිණීමේ ලේඛන පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමට කටයුතු කර ඇති බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවශ්‍යතාවය නිසියාකාරව හඳුනාගැනීමකින් තොරව වැඩ සටහන් 02 හි වැය විෂයය අංක 2003 සඳහා රු. 400,000 ක් හා 2105 සඳහා රු. 1,000,000 ක් ප්‍රතිපාදන වෙන් කර ගැනීම හේතුවෙන් එම සම්පූර්ණ මුදලම වියදම් නොකර ඉතිරිව තිබුණි. | දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ අධ්‍යක්ෂ තම පෞද්ගලික වාහනය භාවිතා කිරීම සඳහා අනුමැතිය ලබා ගෙන තිබූ බැවින්, එම ආයතනය සඳහා සංචිතයෙන් වෙන් කර තිබූ වාහනය ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර ඇත. ඒ අනුව 220-2-4-2003 වැය විෂයෙන් වෙන් කළ ප්‍රතිපාදන ඉතිරි විය. තවද 220-2-5-2105 වැය විෂය යටතේ ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් වෙනුවෙන් අදාල වර්ෂයේදී අපේක්ෂිත වියදම් ඇති නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව. | ප්‍රතිපාදන සැලසුම් පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාර්ෂික අවශ්‍යතාවය නිසියාකාරව හඳුනා ගැනීමකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් වැඩසටහන් 02 ක මුලධන වැය විෂයයන් 10 ක රු.15,000,000 ක්වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් රු. 11,453,248ක් හෙවත් සියයට 22ත් 97ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. | පශ්චාත් උපාධි අධ්‍යාන කටයුතු සඳහා මුදාහල නිලධාරීන් අදාළ පාඨමාලා අවසන්කර ලබා දිය යුතු සහතික ඉදිරිපත් නොකිරිම මත, රෝහල් වල යන්ත්‍ර උපකරණ අළුත් වැඩියා කටයුතු වෙළෙඳ පොළ පැවති මිල උච්චාවචන හා අමතර කොටස් හිඟවීම හේතුවෙන් අපේක්ෂිත පරිදි ඉටු කර ගත නොහැකි විම මත, හා නාවින්න රෝහලේ ස්කෑන් යන්ත්‍රය අළුත් වැඩියා කිරිමට ප්‍රසම්පාදන පිරිනමා තිබුණද අදාල සැපයුම්කරුට නියමිත දින වන විටත් අමතර කොටස් ආනයනය කර ගැනීමට නොහැකි වීම මත මෙම ප්‍රතිපාදන ඉතිරි වූ බව. තවද අක්මුදල් ලබා දීම සම්බන්ධයෙන් පැවති දැඩි සීමා කිරිම් සහ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛ අනුව ප්‍රතිපාදන ඉතිරි විම සිදුව අති බව. | -එම - |
| (ඇ) | මුලික වියදම් ඇස්තමේන්තුවේ මුලධන හා පුනරාවර්තන වැය විෂයයන් 16ක ප්‍රතිපාදනය සියයට 19 සිට සියයට 2,000 අතර පරාසයකින් වැඩි කරමින් සහ තවත් වැය විෂයයන් 05ක ප්‍රතිපාදනය සියයට 54 සිට සියයට 83ක් අතර පරාසයකින් අඩුකරමින් සංශෝධනය කිරීම යනාදී කරුණු හේතුවෙන් මුලික වියදම් ඇස්තමේන්තුව නිසි අධ්‍යානයකින්, අවබෝධයකින් තොරව හා අතාර්තිකව පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය විය. | මුලික වියදම් ඇස්තමේන්තුව 2022 වර්ෂයේ අගෝස්තු මසදී සැලසුම් කළද ඉන් පසු රට තුළ ඇති වූ උද්ධමනකාරි තත්වය හේතුවෙන් සියළුම භාණ්ඩ හා සේවා වල මිල ගණන් අනපේක්ෂිත පරිදි ඉහල යාම හේතුවෙන් අත්‍යාවශ්‍යම වියදම් පමණක් දරමින් ( එනම් ජලය , විදුලි , දුරකථන, ආහාර හා ඖෂධ) රෝගී සත්කාරක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුකර ඇති බව. | -එම - |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(1) විධිවිධාන වලට පටහැනිව පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 36ක රු. 12,964,091ක්වූ ඉතිරිවීම් ඉක්මවා රු. 37,942,645ක බැරකම් වලට බැඳී තිබුණි. තවද වැය විෂයය අංක 2-5-0-1201 යටතේ ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන සලසා නොගෙන බැරකම් වලට බැඳී තිබුණි. | රට තුළ ඇති වූ උද්ධමනකාරී තත්වය හේතුවෙන් සියළුම භාණ්ඩ හා සේවා වල මිල ගණන් අනපේක්ෂිත පරිදි ඉහල යාම නිසා රෝගී සත්කාරක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වියදම් දැරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ හෙයින් වර්ෂයේ මැද භාගයේ සිටම අතිරේක ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කිරිමට කටයුතු කළද පවතින ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලැබුණු බව. එහෙත් දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ වැය ශිර්ෂ සඳහා ඉහත පරිදි ප්‍රතිපාදන ඉක්මවා බැදීම් වාර්තා වී ඇති බව. | මුදල් රෙගුලාසි 94(1) විධිවිධාන යටතේ හඳුනාගත යුතු බැරකම්, වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම් වෙනුවෙන් එළඹෙන බැදීම් හා මුළු පිරිවැය ඇස්තමේන්තු මත බැදීම් වශයෙන් වෙන වෙනම හඳුනාගෙන අදාළ ආකෘතියට අනුව වාර්තා කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබාගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු. 6,710,968ක් බව එම සංස්ථාවේ ගිණුම් අනුව තහවුරු වන නමුත් එම සංස්ථාවට ගෙවිය යුතු මුදල රු. 185,000 ක් ලෙස දෙපාර්තමේන්තුවේ බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. | 2023.12.30 දිනවන විට වාර්තා වූ සියළුම බැරකම් ගිණුමට ඇතුලත් කර ඇති අතර එම බැරකම් සඳහා 2024.04.05 දින නිරවුල් කර ඇත. විමසුමට ලක්කල කාරණය පිළිබඳ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ බැරකම් හා බැදීම් රු 5,445,200/- ක් පමණක් සඳහන් කර ඇති අතර එම බැරකම් සඳහා 2023 නොවැම්බර් මස ගෙවීම් කර අති අතර බව. | සියළු බැරකම් නිවැරදිව හඳුනා ගෙන බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂවලදී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබා ගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,265,768 ක් ගෙවිය යුතුව පවතින බව එම සංස්ථාවේ ගිණුම් අනුව තහවුරු වූ නමුත් එම බැරකම දෙපාර්තමේන්තුවේ බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | 2022 වර්ෂයට පෙර ඖෂධ සංස්ථාවෙන් ලබා ගෙන තිබූ ඖෂධ වෙනුවෙන් 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවට ගෙවීම් සඳහා වවුචර් ඉදිරිපත් වී නොමැති අතර මේ සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් ලබා දෙන මෙන් ආයුර්වේද සංස්ථාව වෙත ලිපියක් යොමු කර ඇත. එම තොරතුරු ලද පසු අවශ්‍ය කටයුතු සිදු කර වාර්තා කරන බව. | -එම- |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 02කින් අවශ්‍යතා 05ක් සඳහා ලබාදුන් රු.53,083,332ක ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසානයේ රු.15,630,895ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එකී ප්‍රතිපාදන ඉතිරිවීම් මුළු ප්‍රතිපාදන වලින් සියයට 08 සිට සියයට 31 දක්වා පරාසයක් ගෙන තිබුණි. | 2023 වර්ෂයේ කැබිනට් අනුමැතිය මත බඳවා ගත් බහු කාර්ය සංවර්ධන සහයකයින්ගේ වැටුප් බහු කාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවෙන් වෙන් වුවද එය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන තුලින් කළමනාකරණය කිරීමට හැකි වූ බැවින් 11-1003-0-1-1-334වැය විෂය ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වන අතර අනෙකුත් වැය විෂයන් යටතේ සැලසුම් කළ සියළුම වැඩ සටහන් ඇස්තමේන්තු ගත වියදමට වඩා අඩුවෙන් ඉටු කර ගැනීමට හැකි වූ බැවින් ප්‍රතිපාදන ඉතිරි වූ බව. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන හැකිතාක් දුරට ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

## 2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21.3 වගන්තිය ප්‍රකාරව, වැඩ තහනමට ලක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කිරීම අත්‍යාවශ්‍ය වුවද, වැඩ තහනමට ලක්වී වර්ෂ 3ත් වර්ෂ 10ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු. 177,985 ක් ද, වර්ෂ 20 ක කාලයක් ඉක්මවා තිබුණු නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු. 127,060 ක් ද, අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | වැඩ තහනමට ලක්වී වර්ෂ 3ත් වර්ෂ 10ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු. 177,985 ක් වූ ණය නිරවුල් කිරීමට අදාලව ඇපකරුවන්ගෙන් අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව, විනය පරීක්ෂණය අවසන් වී නැවත සේවයේ පිහිටුවා ඇති නිලධාරියාගේ වැටුපෙන් මේ වන විට අයකර ගැනීම සිදු කරනු ලබන බව, නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු. 127,060 ක ණය නිරවුල් කිරීමට අදාලව වසර 20 කට අධික කාලයක් ගත වී ඇති බැවින් තොරතුරු අනාවරණය කර ගැනීම තරමක දුෂ්කර කටයුත්තක් බවට පත්ව ඇති බව, කෙසේ නමුත් ණය අයකර ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන බව . | පසු විපරම් කිරීම හා ප්‍රමාණවත් අධීක්ෂණය මගින් ණය අයකර ගැනීම කඩිනම් කළ යුතුය. ආයතන සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමේ වගකීම ඉටුනොකල නිලධාරීන්ගෙන් මෙම මුදල අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 (2) “ආ” ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, 4.2.5 වගන්තිය ප්‍රකාරව නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදල් වලින් හෝ අයකර ගත යුතුය. නමුත් 2023 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගොස් වසර 02ක් ඉක්ම වූ නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.619,110 ක් වූ අතර එම ණය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව හා මුදල් අයකර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. විශ්‍රාම ගිය නිලධාරීන් අතුරින් විශ්‍රාම ගොස් දැනට අවුරුදු 20 කට අධික කාලයක් ගත වී ඇති නිලධාරීන් තිදෙනා සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගැනීම තරමක දුෂ්කර කටයුත්තක් බවට පත් ව ඇති බව. කෙසේ වෙතත් ඉදිරියේ දී තවදුරටත් මෙම ණය ශේෂයන් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගෙන නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | නිලධාරියකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක වෙත ඉදිරිපත් නොකළ හා නොසැලකිලිමත්ව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දින වන විට සේවය හැරගිය වර්ෂ 01ක් වර්ෂ 03ක් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරින් 09 දෙනෙකුගෙන් රු. 701,686ක්ද, වර්ෂ 05ක් වර්ෂ 10ත් අතර කාලයක් ගත වී තිබුණු නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු. 306,950 ක්ද වර්ෂ 20ක් ඉක්මවා තිබුණු නිලධාරින් 21 දෙනෙකුගෙන් රු. 883,610 ක්ද, අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අය වීමට ඇති ණය මුදල ගෙවන ලෙස නිලධාරින් දැනුවත් කර ඇති බව. 2024.06.30 දින වන විට ගෙවීම පැහැර හැරිය හොත් ඇප කරුවන් වෙතින් අයකර වාර්තා කිරිමට සටහන් කර ගත් බව. තවද එක් නිලධාරියකු වාරික වශයෙන් ගෙවීම් ආරම්භ කර ඇති බව. | ණය මුදල් අයකර ගැනීම සඳහා වහාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5,4.6 හා 6.3 වගන්තිය හා 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයෙහි 03 (ආ) ඡේදය, 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනයෙහි 04 ඡේදය ප්‍රකාරව මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත්, මියගොස් 2023 දෙසැම්බර් 31 දිනට මාස 06 කට වැඩි කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු. 642,644 ක් වූ අතර එම ණය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | රු.49,300.00 ක ණය ශේෂක් සහිත නිලධාරීයා මියගොස් දැනට අවුරුදු 20 කට අධික කාලයක් ගත වී ඇති බව. එකතුව රු. 121,250 ක් වූ නිලධාරීන් 02 දෙනෙකුට අදළ මරණ පාරිතෝෂික මුදල් ගෙවනු ලබන අවස්ථාවේ දී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව හා රු.119,550ක ණය ශේෂය මරණ පාරිතෝෂිකය සහ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් සකස් කෙරෙමින් පවතින අතර එය ගෙවීමට ඉදිරිපත් වූ වහාම අදාල ණය ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. රු.178,910.00 ක ණය ශේෂයක් සහිත මෙම නිලධාරියා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වන ඇල්පිටිය ප්‍ර.ලේ.කා. වත්කම් පිළිබඳ තහවුරුවක් ලැබී ඇති අතර වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුපප ගෙවන බවට තහවුරු කර ඇති බව. ඒ අනුව මරණ පාරිතෝෂිකය ගෙවීම් කිරීමේදී ණය මුදල නිරවුල් වී ඇත්ද යන්න විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් තොරතුරු අනාවරණය කර ගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කර වාර්තා කරන බව. එකතුව රු. 173,634 ක් වූ නිලධාරීන් 03 දෙනෙකුට අදළ මරණ පාරිතෝෂිකයන් මෙතෙක් ගෙවා නොමැති බැවින් ගෙවන අවස්ථාවේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහය හා අදාල මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |

## 2.5 තැන්පතු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම් 3 ක පැවැති වසර 2 ත් 5 ත් අතර කල් ඉකුත් වූ හා එකතුව රු. 354,958ක් වූ තැන්පතු, මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද වසර 2 ඉක්මවූ තැන්පතු පැවතීමට හේතුවූ කරුණු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ 03 ප්‍රකාරව වාර්තා කර නොතිබුණි. | ඉහත පරිදි 2021.12.31 දිනට අදාල වූ තැන්පතුව වසර දෙක ඉක්මවා නොතිබීම හේතුවෙන් වසර 1-2 කාලයට අදාළව සටහන් කර ඇත. විගණන නිරීක්ෂණ අනුව එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ගිණුමට අදාළ කේවල ශේෂ ලැයිස්තුව අනුව 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.3,038,130 ක් වුවත් තැන්පතු ගිණුමට අනුව ශේෂය රු.3,762,375ක් විය. ඒ අනුව රු.724,245ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021.12.31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය හා කේවල ශේෂ ලැයිස්තුව තුලනය කර ඇති බව. | **වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට** අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.6 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිම හා පියවීම

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව නිලධාරින් 06 දෙනෙකු වෙත අවස්ථා 04 කදී ලබාදෙන ලද එකතුව රු.469,179ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම වැය නොකර දින 03ත් 20ත් අතර කාලයක් එම මුදල් අත රඳවාගෙන මුළු මුදලම පියවා තිබුණි. | විගණන විමසුමෙහි සඳහන් කර ඇති අත්තිකාරම්වලට අදාලව සැලසුම් කළ වැඩ සටහන් නොපැවැත්වීම, වැඩ සටහන් කල් දැමීම හා වැඩ සටහන් නිම කිරිමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම වැනි හේතු නිසා තත්කාර්ය අතුරු අග්‍රිමය, මුළු මුදල ලෙසම පියවා තිබුණි. වැඩ සටහන් නියත වශයෙන් පැවැත්වීම සහතික කර ගැනිමෙන් පසුව අත්තිකාරම් ලබා ගැනීමට කටයුතු කරන ලෙසට අදාල නිලධාරින් දැනුවත් කරන ලද බව. | **මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.** |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ඊට අනුගතව කටයුතු කර නොතිබුණු අතර අරමුණු හා ප්‍රතිපත්ති වෙනස් කිරිමේදී ඒ අනුව ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව දැනට ප්‍රධාන කාර්ය සාධන දර්ශක තුනක් හඳුනාගෙන ඇති බව. ප්‍රගතිය වාර්තා කිරිමට සටහන් කරගත් බව. | සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වන අයුරින් අවශ්‍ය කාලීන සංශෝධන සහිතව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 කාර්යයභාරයන් ඉටු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය දක්වාම එය අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර ව්‍යාපෘතිය සඳහා 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 877.2 ක් වැය කර තිබුණි. 2022 වර්ෂයේ සිට ව්‍යාපෘතිය සඳහා වෙනම ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර සංවර්ධන වැඩසටහනේ රෝගී ප්‍රතිකාර සේවා ව්‍යාපෘතිය යටතේ පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ගෙන නිලධාරීන් 218 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 287.4 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 5.5 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 292.9 ක් වැයකර තිබුණි. කෙසේ වුවද අනෙකුත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පරිපාලන වියදම් දෙපාර්තමේන්තුවේ රෝගී ප්‍රතිකාර සේවා වැය විෂයයන් මගින් ආවරණය කරමින් තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය අවසන් කර ව්‍යාපෘතිය යටතේ ඇති මානව හා භෞතික සම්පත් විධිමත්ව උතුරු මැද පළාත් සභා මට්ටමින් ක්‍රියාත්මක වන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවාවට භාරදීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ව්‍යාපෘති කාලසීමාව අවසන්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවේනම් එය සතුව පැවති භෞතික හා මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමට හෝ උතුරු මැද පළාත් සභා මට්ටමින් ක්‍රියාත්මක වන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවාවට සඳහා යොදා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය අනුමැතීන් ලබාගෙන ඒ අනුව ව්‍යාපෘති කාර්යාල නඩත්තුව හා කාර්ය මණ්ඩල සඳහා දරන වියදම් සීමා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් 2024 අප්‍රේල් 10 වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට | මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව මේ වන විට අදාල යන්ත්‍ර හා උපකරණ ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත මාරු කිරීමට කටයුතු කර ඇති බව. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම මිලදී ගැනීම සඳහා දායකවූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු. 28,342,712 ක මුළු මුදල අනාර්ථික වියදමක් විය. | | |
| (ඇ) | ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියම ඇතුළත්වන පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සැකසීම සඳහා 2021 වර්ෂයේ මෙන්ම 2022 වර්ෂයේදීද රු. මිලියන 25 බැගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම කාර්යය සමාලෝචිත වර්ෂයේදීද ඉටුකර නොතිබුණි | 2023 වර්ෂයේදී මේ සඳහා ප්‍රතිපාදන සලසා නොමැති බව. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, යනාදී සියළුම අංශවල කටයුතු සම්බන්ධීකරණය කළ හැකි කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |

## 3.3 කාර්යය සාධන දර්ශක

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඔසු උයන් ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගතියද සමාලෝචනය කර නොතිබුණි. | මේ සම්බන්ධව දැනට ප්‍රධාන කාර්ය සාධන දර්ශක 03ක් හඳුනාගෙන ඇති බව. ප්‍රගතිය වාර්තා කිරීමට සටහන් කරගත් බව. | කාර්යසාධන දර්ශක කඩිනම් පිහිටුවා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය. |

## 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සමඟ 2022 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත්කර තිබුණු නමුත් 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය යටතේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව එම වාර්තාව නිවැරදිව පිළියෙල කර නොතිබුණි. | 2020 අගෝස්තු මස 28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව එහි 3 පරිච්ඡේදයට අදාළ මූල්‍ය ප්‍රකාශ ගිණුම් අංශය මගින් ඉදිරිපත් කර ඇත. එහි 4 පරිච්ඡේදයට අදාළ කාර්ය සාධන දර්ශක සහ 5 පරිච්ඡේදයට අදාළ තිරසර සංවර්ධන අරමුණු 2023 වර්ෂය අවසාන වන තෙක් හඳුනාගෙන නොතිබිණි. ඒ අනුව 4,5,6, සහ7 පරිච්ඡේද සහිතව කෙටුම්පතක් කාර්ය සාධන වාර්තාව රජයේ විගණනය වෙත යොමු කිරිමට එකගතාවය පළ කරන බව. | 2023 වර්ෂයේ සිට ඉදිරියට වාර්ෂික ගිණුම් සමඟ නිවැරදි ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති හා 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් විගණකාධිපති වෙත එවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අත්සන් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට සටහන් කර ගත් බව. | 2020 අගෝස්තු 28 දිනැති හා 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රුපියල් මිලියන 1,164.13ක් වැය කර ඉදිකරන ලද බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව ගොඩනැගිල්ලේ වැඩ නිමකර වසර 03කට අධික කාලයක් ගතවී තිබුණද ගොඩනැගිල්ල පූර්ණ ධාරිතාවයෙන් උපයෝජනය කිරීමට අවශ්‍ය ප්‍රධාන ජල ටැංකියක්, පල්දෝරු පද්ධතියක් හා ප්‍රධාන විදුලි සම්බන්ධතාවය ආදී කාර්යයන් අවසන් කර නොතිබුණි. ඒ සඳහා 2023 පෙබරවාරි 10 දින රු.715,267,800 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණු නමුත් එය ඉටු කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම වාට්ටු සංකීර්ණයෙහි පෙන්වා දී අඩු පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඔබගේ විමසුමෙහි දක්වා ඇති ප්‍රතිපාදන අවශ්‍ය වේ. ඒ අනුව 2024 අයවැය ප්‍රතිපාදන අනුව රුපියල් මිලියන 450 ක මුදලක් වෙන් කර ඇති අතර එමගින් අදාල ගොඩනැගිලි වෙනුවෙන් අනුකූලතා සහතිකය ලබා ගැනීමට අදාල කොටස් සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇති අතර එයට අදාල දීප ව්‍යාප්ත ලංසු කැඳවීම 2024 අප්‍රේල් මාසය තුල අවසන් කිරීමට සැලසුම් කර ඇති බවත්, දැනට මහල් 03 ක රෝගීන් ඇතුලත් කර තිබුනද විධිමත් රෝගී සත්කාරක සේවාව සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කර නොමැති බව. | ගොඩනැගිල්ල පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට සැලසුමක් සකස් කර ඒ අනුව කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.3 මාර්ගෝපදේශය ප්‍රකාරව පිළිගත් ආයතනයක් වෙත යොමු කර ප්‍රමිතිය සම්බන්ධයෙන් වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ හතරවන කාර්තුවේ තලතෙල් බෝතල් 1,980ක්, මීතෙල් බෝතල් 22ක්, මී පැණි බෝතල් 400ක් හා අබතෙල් බෝතල් 200ක් මිළ දී ගෙන තිබුණි. | තත්ත්ව සහතික බැලීමේ ක්‍රමයක්/ප්‍රමිතිය සම්බන්ධයෙන් වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමක් සාමාන්‍යයෙන් රෝහල තුළ ක්‍රියාත්මක නොවන අතර, යම් ඖෂධයක් සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් අවශ්‍ය බවට ඖෂධ කමිටුව විසින් හඳුනාගන්නා ලද අවස්ථාවක එවැනි ඖෂධ කොළඹ විශ්වවිද්‍යාලයට හෝ නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය වෙත යොමු කර වාර්තා ලබා ගැනිමේ ක්‍රමවේදයක් පවතින බව. | ඖෂධ නිපදවීමට මිලදී ගනු ලබන අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.3 මාර්ගෝපදේශීය ප්‍රකාරව පිළිගත් ආයතනයක් වෙත යොමු කර ප්‍රමිතිය සම්බන්ධයෙන් වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා භාවිතා කරන ඉඩම් 27 ක් පැවැති නමුත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, බොරැල්ල ශික්ෂණ රෝහල ඇතුළුව රෝහල්, ඖසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල හා සංචාරක බංගලා පිහිටි ඉඩම් 19 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | මෙම ඉඩම් දෙපාර්තමේන්තුවේ දැනට භුක්ති විඳින පදනමින් අදාල හිමිකම ඇති ආයතන වෙතින් පවරා ගැනීමට එම ආයතන සමඟ කළමනාකරණ කටයුතු සිදු කරන අතර අවසන් කළ වහාම වාර්තා කිරීමට සටහන් කර ගත් බව. | අදාළ ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | ඇමෙරිකා එක්සත් ජනපදයේ රෝහල් සේවා පදනම නමැති රාජ්‍ය නොවන සංවිධානයේ ආධාර වශයෙන් 2022 අගෝස්තු මස ලැබී තිබුණු වර්ග 19කට අදාල රෝගී සත්කාරක උපකරණ ඒකක 377 ක් භාවිතයට නොගෙන බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව අටමහල් ගොඩනැගිල්ලේ ගබඩාකර තිබුණු අතර එම භාණ්ඩවල වටිනාකම ගණනය කර ගිණුම්ගත කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | 2022.08.19 USA Hospital Services Foundation මගින් ලද, වටිනාකමක් සොයාගත නොහැකි උපකරණ සහ උපකරණ ඒකක සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු වෙත වාර්තා කර ඇති බවත්, ජීව වෛද්‍ය ඉංජිනේරු නිලධාරි මෙම උපකරණ සියල්ල පරීක්ෂා කරබලා මේ සඳහා අවශ්‍ය සෙසු උපකරණ ලැයිස්තුවක් ලබා දීමට එකග වී ඇති බව. | රෝගී සත්කාරක උපකරණ ඒකක භාවිතයට ගැනීමට හා එම භාණ්ඩවල වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශේෂඥ වෛද්‍යවරයකු නොමැති බැවින් උගුර, කන, නාසය සම්බන්ධ වර්ග 10ක ශල්‍ය උපකරණ ඒකක 35ක් හා කොවිඩ් සමයේ චීන රජයෙන් පරිත්‍යාග ලෙස ලැබුණු පුද්ගල ආරක්ෂක ඇඳුම් කට්ටල 21,120ක් බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව අටමහල් ගොඩනැගිල්ලේ නිශ්කාර්යව පැවැති බව නිරීක්ෂණය විය | මෙම භාණ්ඩ බොහොමයක් ENT අංශයට අදාල භාණ්ඩ වේ. උගුර, කන හා නාසය සම්බන්ධ (ENT) විශේෂඥ වෛද්‍ය නිලධාරියකු නොමැති අතර විශ්ව විද්‍යාලයේ උපදේශක වෛද්‍ය නිලධාරී මගින් මෙම අංශය ක්‍රියාත්මක කර ඇති බව. මෙම භාණ්ඩ උපයෝගී කරගෙන දෛනික ප්‍රතිකාර කිරීමේ අවශ්‍යතාව ඇති නමුත් ඒ සඳහා විශේෂඥ වෛද්‍ය නිලධාරි පුරප්පාඩුවක් පවතින අතර එය සම්පූර්ණ කර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කර ඇති බව. | උගුර, කන, නාසය සම්බන්ධ වර්ග 10ක ශල්‍ය උපකරණ ඒකක 35ක් හා කොවිඩ් සමයේ චීන රජයෙන් පරිත්‍යාග ලෙස ලැබුණු පුද්ගල ආරක්ෂක ඇඳුම් කට්ටල 21,120 ක් භාවිතයට ගැනීමට හැකි ඉක්මනින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව අටමහල් ගොඩනැගිල්ලේ සාමාන්‍ය වාට්ටු ඇඳන් 288ක ධාරිතාවයෙන් 120ක් හෙවත් සියයට 42ක්ද රෝහලේ පැරණි සාමාන්‍ය වාට්ටුවල ඇඳන් 274කින් 76ක් හෙවත් සියයට 28ක්ද ඌණ උපයෝජිතව පැවැති බවද නව ගොඩනැගිල්ලේ නවීන කාමර පහසුකම් වලින් සමන්විත ඇඳන් 88ක ධාරිතාවයෙන් යුක්ත ගෙවන වාට්ටු සියල්ලම සහ පැරණි ගෙවන වාට්ටු 32කින් 08ක් ඌණ උපයෝජිතව පැවති බවද නිරීක්ෂණය විය. | හෙද කාර්ය මණ්ඩලය හිඟකම නිසා මෙම වාට්ටු පවත්වාගෙන යාමට නොහැකි වී ඇති බව දන්වන අතර කාර්ය මණ්ඩල බඳවාගත් වහාම මෙම වාට්ටු පවත්වාගෙන යා හැකි බව. | අවශ්‍ය කාර්ය මණ්ඩල හැකි ඉක්මණින් බඳවාගෙන ඌණ උපයෝජිතව පවතින සාමාන්‍ය වාට්ටු, නවීන කාමර පහසුකම් වලින් සමන්විත නව ගෙවන වාට්ටු සියල්ලම සහ පැරණි ගෙවන වාට්ටු රෝගී සත්කාරක සේවා වෙනුවෙන් උපයෝජනය කළ යුතුය. |

**3.7 පාඩු හා හානි**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ මහ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් බොරැල්ල, ශ්‍රී ලංකා ජාතික ආයුර්වේද රෝහල් ගබඩාවේ පැවති කොත්තමල්ලි තොගයක් පරික්ෂාවට භාජනය කර එය පරිභෝජනයට නුසුදුසු බව දන්වා ඖෂධ නිෂ්පාදනාගාරයේ කාමරයක දමා මුද්‍රා තබා වසරකට වැඩි කාලයක් ගත වී තිබුණු නමුත් නිසි පරිදි ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් පිරිවැය රු.327,700 ක් වූ කොත්තමල්ලි කිලෝග්‍රෑම් 1130ක් විනාශ වී තිබුණි. එසේ වුවද මුදල් රෙගුලාසි 104 (1) පරිදි ඊට වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර එම තොගයේ අලාභය ඔවුන් වෙතින් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාල අලාභය කොළඹ මහ නගර සභාවෙන් අයකර ගැනීමට කටයුතු කරන අතර ප්‍රගතිය වාර්තා කිරිමට සටහන් කර ගත් බව. | මුදල් රෙගුලාසි 104 (1) පරිදි ඊට වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර එම තොගයේ අලාභය ඔවුන් වෙතින් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මංචංතොඩුවායි ආයුර්වේද රෝහලේ සේවය කර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරුවී තිබුණු ආයුර්වේද වෛද්‍යවරයෙකුට 2012 ජූලි මාසයේ සිට 2013 සැප්තැම්බර් මාසය දක්වා මාස 15 ක් තුළදී දෙපාර්තමේන්තුව විසින් වැටුප් ලෙස රු.548,376 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු නොකර සියයට 25ක අධිභාරයක්ද ද සමඟ 2024 අප්‍රේල් 05 දින වන විට රු.519,600 ක් පමණක් අයකර ගෙන තිබුණි. මෙම සිද්ධියට වසර 10කට අධික කාලයක් ගතවී තිබුණු නමුත් ඉතිරි මුදල් අයකර ගැනීම සහ අදාළ වගකිවයුතු නිලධාරින්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් | අදාළ වෛද්‍යවරයාගෙන් අයවිය යුතු රු. 185,870 ක මුදල අයකර ගැනීම සඳහා දන්වා ඇති අතර 2024.04.03 දින රු.20,000ගෙවා ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීම සම්බන්ධව නීතීමය පියවර ගැනීමට විමර්ශන අංශය දැනුවත් කර ඇති බව. | තවදුරටත් අයවිය යුතුමුදල් අයකර ගැනීමටත් මුදල් රෙගුලාසි 104 (2) "ආ" ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමටත් කටයුතු කළ යුතුය. |

රෙගුලාසි 104 (2) “ආ”පරිදි වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

### 3.8 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතුව ඔසු උයන් 08ක් පවතින අතර සමාලෝචිත වර්ෂයේ ඔසු උයන් 05කින් පමණක් ඖෂධීය අමුද්‍රව්‍ය වර්ග 35කින් කිලෝග්‍රෑම් 629.17ක් ලබා ගෙන ආයුර්වේද ජාතික රෝහලට කිලෝග්‍රෑම් 552ක්ද, බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය වෙත කිලෝග්‍රෑම් 18ක්ද, ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත කිලෝග්‍රෑම් 59.5ක් සපයා තිබුණි. නාවින්න, කන්නෙලිය හා මිහින්තලේ යන ඔසු උයන් වලින් ඉකුත් වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් කිසිදු ඖෂධ වර්ගයක් සපයා ගෙන නොතිබුණි. | නාවින්න ඔසු උයන පර්යේෂණ හා ව්‍යාප්ති සේවා සඳහා පමණක් යොදා ගනු ලබන අතර එය පර්යේෂණ ආයතනයෙහි උද්‍යානය ලෙස සැලකෙන බව. මිහින්තලය මේ දක්වා ඔසු උයනක් ලෙස ක්‍රියාත්මක වී නොමැති අතර පර්යේෂණ රෝහල පිහිටා ඇති ඉඩම ලෙස සැලකෙන බව. කන්නෙළිය ඔසු උයන තුළද මහා පරිමාණ ඖෂධ වගාව සිදු නොකරන අතර එය පර්යේෂණ හා ව්‍යාප්ති සේවා සඳහා පමණක් යොදා ගනු ලබන බව හා මේ වන විට ඔසු උයන්වල කාර්යභාරය හා අරමුණු සංශෝධිත පනත මගින් වෙනස් කරමින් මහා පරිමාණයෙන් ඖෂධ නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇති බව. | ඔසු උයන්වලින් ලැබෙන ඵලදාව ආයුර්වේද රෝහල් වල ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීමට හා ඒ පිළිබඳ ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීමට විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුව සතුව වාහන 57 ක් පැවැති අතර මෙම වාහනවලට අදාළ ලොග් පොත් හා ධාවන සටහන් විධිමත් පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම, කාලීනව ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබීම, ඇතැම් නිලධාරීන් නිසි අනුමැතියකින් තොරව වාහන භාවිතා කර තිබීම, වාහන අවභාවිතා කල නිලධාරීන් හා රියදුරන් සම්බන්ධයෙන් විනය පියවර නොගැනීම,වාහන සඳහා ඉන්ධන පිරවීමේදී එම කටයුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර නොතිබීම, ඇතැම් නිලධාරීන් නිසි අනුමැතියකින් තොරව වාහන භාවිතා කර තිබීම හා වාහන අවභාවිතා කළ නිලධාරීන් හා රියදුරන් සම්බන්ධයෙන් විනය පියවර නොගැනීම, වාහන ධාවන අවසර පත්‍ර පරීක්ෂාවන් නිසි පරිදි සිදු නොවීම සහ රියදුරන්ගේ අක්‍රමිකතාවයන් වලක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රම අනුගමනය නොකිරීම යනාදී කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය හා වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොපැවැති බව නිරීක්ෂණය විය. | ලොග් පොත් යාවත්කාලීන කරමින් පවතින බව. ප්‍රවාහන අංශයේ සියලුම රාජකාරි කටයුතු සඳහා සිටින්නේ ප්‍රවාහන නිලධාරි පමණක් බැවින් දෛනික ධාවන සටහන් පත්‍ර නිතිපතා පරික්ෂා කිරිමට හැකියාවක් නොමැති බව. ඔබ විසින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව අදාල නිලධාරින් දැනුවත් කර සෑම අවස්ථාවකම ධාවන අවසර පත්‍රයෙහි මාණ්ඩලික නිලධාරියාගේ නිර්දේශය හා අනුමැතිය අනුව රාජකාරි සඳහා වාහන යොදවනු ලබන අතර ඇතැම් අවස්ථාවන්හිදි මාණ්ඩලික නිලධාරීන් කාර්යාලයේ රැදි නොමැති අවස්ථාවන්හිදි රාජකාරියේ ස්වභාවය අනුව මාණ්ඩලික නිලධාරියාගේ වාචික අනුමැතිය පරිදි අදාළ රාජකාරි සඳහා වාහන යොදවා ඇති බව. කෙසේ වුවද මෙම තත්වය පාලනය සඳහා පියවර ගෙන ඇති බව. | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් පරිදි, පාලන පටිපාටි යථා පරිදි සිදුවන බවට නිරීක්ෂණය නොවන බැවින් ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | වර්ෂ කිහිපයක අනුමත නිවාඩු ප්‍රමාණය ඉක්මවා නිවාඩු ලබා ගෙන තිබුණු බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලේ ආයුර්වේද සේවා සහයකයින් 08 දෙනෙකුගේ උසස්වීම් අයදුම්පත් නිර්දේශ කර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරිමේදී ඔවුන්ගේ වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර දක්වා නොතිබුණු බැවින් ඒ පිළිබඳව අවධානය යොමු නොකර 2023 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම නිලධාරීන්ට උසස්වීම් ලබා දී තිබුණි. | ආයුර්වේද සේවා සහයකයින් සඳහා 2023 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් ලබා දීමට අදාල අයදුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත නිර්දේශ කර ඉදිරිපත් කිරීමේදී ඔවුන් ලබා ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ වෙන් වෙන් වශයෙන් දන්වා නොමැති බව පිළිගන්නා අතර, නිවාඩු පිළිබඳ පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීමටත් ඉදිරියේදී මෙම තත්වය ඇති වීම පාලනය කර ගන්නා ලෙසත් රෝහල් අධ්‍යක්ෂ වෙත දැනුවත් කර ඇති බව. | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් පරිදි, පාලන පටිපාටි යථා පරිදි සිදුවන බවට නිරීක්ෂණය නොවන බැවින් ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලේ සේවය කරන නිලධාරීන් 44 දෙනෙකු විසින් නිසි අනුමැතියකින් තොරව ලබාගෙන තිබුණු නිවාඩු සහ අනුමත සීමාව ඉක්මවා ලබාගෙන තිබුණු නිවාඩු දිනයන් වැටුප් රහිත නිවාඩු ලෙස සලකා කටයුතු නොකිරීම හේතුවෙන් රු.453,475 ක වැටුප් වැඩියෙන් ගෙවා තිබුණි. | රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර නිලධාරි අනුමත කාර්යමණ්ඩලය 12ක් වන අතර එවකට සේවයේ යෙදී සිට ඇත්තේ නිලධාරීන් 04ක් පමණක් බවින් මෙම නිලධාරී හිඟය හේතුවෙන් සීමිත නිලධාරී කොටසකගෙන් ඉටුකරවා ගැනීමට සිදුවීම මත නිසි අනුමැතියකින් හා දැනුවත් කිරීමකින් තොරව සේවකයින් විසින් ලබාගන්නා ලද නිවාඩු පිළිබඳ නියමිත කාලය තුළ දැනුවත් කිරීමට නොහැකි වූ බව කාරුණිකව පෙන්වා දෙන බව. මෙම තත්වය ඉදිරියේදී නිවැරදි කරගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් පරිදි, පාලන පටිපාටි යථා පරිදි සිදුවන බවට නිරීක්ෂණය නොවන බැවින් ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) | කොළඹ විශ්ව විද්‍යාලය යටතේ පාලනය වන දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය 2017 ජුනි 02 සිට බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ 05 වන මහලේ ස්ථාපිත කර තිබුණද ඒ සඳහා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මාසික කුලියක්ද අයකර ගෙන නොතිබුණි. තවද අදාළ ආයතනය විසින් 2018 සිට 2023 නොවැම්බර් දක්වා භාවිතා කර තිබුණු විදුලිය වෙනුවෙන් දෙපාර්තමේන්තුව ගණනය කර තිබුණු රු.7,571,445ක හිඟ විදුලි පරිභෝජන ගාස්තුව හෝ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නොහැකිව තිබුණි. | දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය බොරැල්ල ආයුර්වේද රෝහලේ 5 වෙනි මහලේ ස්ථාපිත කිරීමට අදාලව විධිමත් ලෙස අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමකට එළඹී බවට කිසිදු ලියකිවිල්ලක් අප සතුව නොමැති අතර ඒ පිළිබඳ සාකච්ඡා කර ඉදිරි කටයුතු කිරීමට එකඟ වෙන බව. විධිමත් ආකාරයට තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්තාවක් ලබාගෙන ගාස්තු අයකිරීමට සාකච්ඡා මට්ටමින් පවතින බව. අදාල කටයුතු අවසන් කර විගණනයට වාර්තා කිරීමට සටහන් කර ගෙන ඇති බව. හිඟ ජල පරිභෝජන ගාස්තුව හා හිඟ විදුලි ගාස්තු අයකර ගැනිම සම්බන්ධයෙන් අදාල ආයතනය දැනුවත් කර තිබු අතර ඒ අතරින් 2023 දෙසැම්බර් මස දක්වා අදාල ජල පරිභෝජන ගාස්තු ලෙස රු. 22,200 ක මුදලක් ගෙවා අවසන් කර ඇති බව. | දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු අතර තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්තාවක් ලබාගෙන ගාස්තු අයකිරීමට විධිමත් ගිවිසුමකට එළඹ මාසික කුලියක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලේ පවත්වා ගෙන යන වෙළඳකුටි පරික්ෂා කර තත්සේරු කිරීම සඳහා පත්කළ කමිටුවක් විසින් 2020 මාර්තු 14 දින ඉදිරිපත් කළ නිරීක්ෂණ අනුව රෝහලේ ආපනශාලාව සුභසාධක සංගමය විසින් රු. 41,600ක මාසික කුළියකට භාහිර පුද්ගලයකුට පවරා අදාල කුලිය සංගමය විසින් ලබාගෙන ඇති බව අනාවරණය වී තිබුණි. 2020 ජුනි 24 දිනැති අංක 02/03 තක්සේරු/2020 දරන ආයුර්වේද කොමසාරිස්ගේ ලිපිය මගින් 2020 ජුනි මස දක්වා අයකරගත් කුලී මුදල් රජයේ ආදායමට බැරකරන ලෙස සුභසාධක සංගමයට දන්වා තිබුණද එම මුදල් රජයේ අදායමට බැර කිරිමට කටයුතු කර නොතිබුණි. | ආයුර්වේද ජාතික රෝලේ සේවක සුභසාධක සංගමයේ ලේකම් වෙත යොමු කර ඇති මාගේ අංක 03/01/05-2-**ii** හා 2021.03.26 දිනැති ලිපියෙහි දක්වා ඇති පරිදි මාසික බදු කුලි පැහැර හැරිම ලෙස ගණනය කර ඇති රුපියල් 400,000 ක මුදල එවකට සුභසාධක සංගමයේ කාරක සභා නියෝජිතයන්ගේ වැටුපෙන් අයකර ගැනීමට සැලසුම් කර ඇති බව. අදාල අයකිරීම් 2024 අප්‍රේල් මස සිට වැටුපෙන් අයකර එහි ප්‍රගතිය ඔබ වෙත වාර්තා කිරිමට සටහන් කර ගත් බව. | අදාල මුදල් සුභසාධක සංගමයෙන් අයකර රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් 2017 වර්ෂයේදී රු.641,128ක් වැයකර බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල් පරිශ්‍රය තුළ අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. ඒ සඳහා රු.19,000ක මාසික කුලියක් තක්සේරු කර තිබුණු නමුත් 2024 ජනවාරි වන විටද, රු.437,000ක්වූ හිඟ කුලිය අයකර ගෙන නොතිබුණු අතර ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සමඟ අදාල කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹීමටද කටයුතු කර නොතිබුණි. | ආයුර්වේද ඖෂධ සංස්ථා සභාපතිගේ අංක MKT/BORELLA/2018 හා 2022.08.19 දිනැති ලිපිය මගින් බදුකුලී ගෙවමින් මෙම රෝහලේ අලෙවිකුටිය පවත්වාගෙන යාම සංස්ථාවට අලාභදායී වන බවත් දන්වා සිටිමින් මහජනතාවට සේවාවක් සිදුවන මෙම අලෙවි මධ්‍යස්ථානය බදුකුලී ගෙවීමකින් තොරව පෙර පරිදිම පවත්වාගෙන යාම සඳහා අවස්ථාව ලබා දීමට අවශ්‍ය කටයුතු සලසන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව. ඉන් අනතුරුව ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොමැති බව නිරීක්ෂණය වන අතර මේ පිළිබඳව අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර අවශ්‍ය ඉදිරි පියවර පිළිබඳව වාර්තා කිරිමට සටහන් කර ගත් බව. මීට අදාලව ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සමග කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹීමට 2024 ජුලි මස 31 දිනට පෙර සිදු කර වාර්තා කිරීමට සටහන් කර ගත් බව. | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සමඟ අදාල කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඖ) | රෝහල් පරිශ්‍රය තුළ පවත්වා ගෙන යන ජාතික පශු සම්පත් මණ්ඩලයේ (NLDB) කිරි අලෙවි මධ්‍යස්ථානය 2014 වර්ෂයේ සිට පවත්වා ගෙන ගොස් තිබුණි. 2022 ජනවාරි 31 දින එම වෙළඳ කුටියෙන් රු.6,000ක මාසික කුලියක් අයකර ගැනීමට තක්සේරු කර තිබුණද, 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාල රු.72,000ක් ලැබිය යුතු හිඟ කුලී අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ජාතික පශු සම්පත් මණ්ඩලය සමඟ අදාළ කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹීමටද කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු හිඟ කුලී මුදල අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන වාර්තා කරන බව. මීට අදාලව ජාතික පශු සම්පත් මණ්ඩලය සමඟ කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොමැති අතර ඉදිරියේදී කොන්දේසි ඇතුලත් ලිඛිත ගිවිසුමකට එළඹීමට කටයුතු කරන බව. | ජාතික පශු සම්පත් මණ්ඩලය සමඟ අදාළ කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

**3.9 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය නිලධාරීන්ගේ ඇප අඥා පනතේ 612 වැනි අධිකාරය, මුදල් රෙගුලාසි 880 හා 881 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ 09 ඡේදය ප්‍රකාරව 2024 මාර්තු 31 දින වන විටත් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අයත් ආයතන වල ඇප තැබිය යුතු නිලධාරීන් 18 දෙනෙකු එකී විධිවිධාන ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් වන ගැටළුකාරී තත්වය විසඳා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි 880 හා 881 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ 09 ඡේදය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින්ගේ සංශෝධිත වාර්තාවක් සෑම වර්ෂ 03 ක් අවසානයට පසුව යෙදෙන පෙබරවාරි 15 දිනට ප්‍රථම අදාල අමාත්‍යාංශයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාව සමඟ තවදුරටත් ඇප තැබීමට අවශ්‍ය නොවන නිලධාරින්ගේ නම්ද, ඇතුලත් විස්තරාත්මක වාර්තාවක් යැවීමට කටයුතු කළ යුතු වුවත් එලෙස ක්‍රියා කර නොතිබුණි. | 2024 වර්ෂයෙන් ආරම්භ කර වසර තුනකට වරක් මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව සංශෝධිත වාර්තාවන් එවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින්ගේ සංශෝධිත වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9,11 හා 11.2 වගන්ති ප්‍රකාරව, ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු අතර තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතුව තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ළඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළ යුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සකස් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර 2024.06.30 දින අදාල කටයුතු ඉටු කිරීමට සැලසුම් කර ඇති බව. | තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේද අදාළ දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ යාවත්කාලීන කළමනාකරණ තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීමට අපහසුව පැවැති අතර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පාලනය, කාර්යසාධන පාලනය, වැටුප් පාලනය, අතිකාල වියදම් පාලනය, පුද්ගලික ලිපිගොනු පාලනය යනාදී පාලනයන් දුර්වල මට්ටමක පැවැති බව නිරීක්ෂණය විය. | මානව සම්පත් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට භාණ්ඩාගාරය සමඟ කටයුතු කරමින් පවතින අතර ප්‍රගතිය ඉදිරියේදී වාර්තා කිරීමට සටහන් කර ගත් බව. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, යනාදී සියළුම අංශවල කටයුතු සම්බන්ධීකරණය කළ හැකි කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2,363ක් වුවද, එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 1,681ක් වුයෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 28කට සමාන පුරප්පාඩු 658ක් විය. තවද මෙම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 109 ක්ද තෘතියික මට්ටමේ පුරප්පාඩු 33ක්, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 296ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 220ක් පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ හා ආයුර්වේද රෝහල්වල කාර්යසාධනයට දැඩි බලපෑමක් සිදු වී තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය පරිපාලන තනතුරේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ 2024.04.02, 04,08,18 සහ 25 යන දින වල දී පවත්වනු ලැබේ. දැනට එම තනතුරේ පුරප්පාඩුව 20 ක් පවතින අතර, මෙම සම්මුඛ පරීක්ෂණය මගින් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට නියමිතය. තවද විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ 2024.04.30 දින පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත. එමෙන්ම උපාධිධාරි හෙද නිලධාරීන් 64 දෙනෙකු ඉදිරියේදී බඳවා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත අනුමැතියට යොමු කර ඇති බව. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සහ රෝහල්වල අත්‍යවශ්‍ය තනතුරුවලට ප්‍රමුඛතාව දෙමින් පවතින මානව සම්පත්වලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා කාර්යමණ්ඩල ප්‍රතිසංවිධානයක් හෝ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරි තනතුරු 18 ක් හා පර්යේෂණ සහායක තනතුරු 12 ක් අනුමත කරගෙන තිබුණද, ඉන් කිසිවෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහලට පර්යේෂණ කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණි. මේ අනුව ආයුර්වේද පර්යේෂණ රෝහල් පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යසාධනයට අහිතකර බලපෑමක් සිදු වී තිබුණි. | නාවින්න, බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය වෙත අනුමත පර්යේෂණ නිලධාරි සහ පර්යේෂණ සහකාර තනතුරු සඳහා බඳවාගැනීම් සම්බන්ධයෙන් ඉදිරියේදී සලකා බැලීමට නියමිත බව. | ආයුර්වේද පර්යේෂණ රෝහල් පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර ගැනීම සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරි සහ පර්යේෂණ සහායක තනතුරු සඳහා බඳවා ගැනිම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, ආයුර්වේද රෝහල් හා අංශ 09 ක් වෙනුවෙන් ස්ථිර නිලධාරින් පත් කිරීමට කටයුතු නොකර ආයුර්වේද කොමසාරිස් ජනරාල් තනතුර සඳහා පූර්ණකාලීන වැඩ බැලීමටත්, නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස් තනතුර හා දේශීය වෛද්‍යක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ අධ්‍යක්ෂක තනතුර සඳහා පූර්ණකාලීන රාජකාරි ඉටුකිරීමටත්, සහකාර කොමසාරිස් - ශිල්පීය, සහකාර අධ්‍යක්ෂක (අධ්‍යාපන කාර්මික), රෝහල් අධ්‍යක්ෂක තනතුරු 08ක් හා නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුරු 02 ක් සඳහා රාජකාරි ආවරණ කිරීමටත් පත්කිරීම් සිදු කර තිබුණි. | නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස් තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ තනතුරක් වුවත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් නොමැති බැවින් III ශ්‍රේණියේ නිලධාරියකු පුරප්පාඩුව සම්පූර්ණ වන දිනය දක්වා පූර්ණකාලීනව රාජකාරී ඉටුකිරීම සඳහා පත්කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමැතිය ලබා දී ඇති බව. දේශීය වෛද්‍යක්‍රම පිළිබඳ ජාතික ආයතනයෙහි අධ්‍යක්ෂ තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ තනතුරක් වන අතර I ශ්‍රේණියේ නිලධාරීන් නොමැති බැවින් ශ්‍රී.ලං.ප.සේ-II ශ්‍රේණියේ නිලධාරියකු පූර්ණකාලීනව රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර ඇති බව. ආයුර්වේද රෝහල් අධ්‍යක්ෂ, බොරැල්ල, ගම්පහ මංචන්තෝඩුවායි,කෝන්නේෂ්පුරී,අම්පාර මැදවච්චිය සහ හම්බන්තොට යන තනතුරු ශ්‍රීලංකා ආයුර්වේද වෛද්‍ය පරිපාලන I ශ්‍රේණියේ තනතුරු වන අතර II ශ්‍රේණියේ තනතුරු වන සහකාර කොමසාරිස් (ශිල්පීය), දේශීය වෛද්‍යක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන කාර්මික) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාවින්න රෝහල යන තනතුරුවල රාජකාරී ආවරණය සඳහා වෛද්‍ය නිලධාරීන් පත්කර ඇති බව හා ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II තනතුර සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණය පවත්වන බව. | සුදුසුකම් සහිත නිලධාරීන්ගෙන් අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| (ඉ) | ප්‍රධාන කාර්යාලය සතුව නේවාසිකාගාරයක් හා සංචාරක නිවාසයක් නොතිබියදීත් නේවාසිකාගාර හා සංචාරක නිවාස භාරකරු සහ අරක්කැමි යන තනතුරු 02ක් අනුමත කරවාගෙන එම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර තිබුණි. | ආයුර්වේද දෙපාර්තමේන්තුවට අනුමත නේවාසිකාගාර භාරකරු තනතුරෙහි සේවයේ නියුතු සේවක මහතා සේවා අවශ්‍යතාවය මත බත්ගොඩ ඔසු උයන වෙත අනුයුක්ත කර ඇති බව, නමුත් එම ඔසු උයන සඳහා නේවාසිකාගාර තනතුරක් අනුමත වී නොමැති බව. අනුමත සංචාරක භාරකරු තනතුරෙහි සේවයේ නියුතු සේවක මහතා සේවා අවශ්‍යතාවය මත කතරගම සංචාරක නිවාසය වෙත අනුයුක්ත කර ඇති අතර එම සංචාරක නිවාසය වෙත සංචාරක බංගලා භාරකරු තනතුර අනුමත වී නොමැති බව. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව නැවත සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. |